# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 665/ 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024

දිනය / திக / Date – 18/04/2024 පැය 1040

## මාධ්‍ය නිවේදනය

**පාරිසරික වැරදි සම්බන්ධව තොරතුරු ලබා ගැනීම සඳහා 1997 හා 1981 කෙටි දුරකතන අංක සම්බන්ධව තවදුරටත් මහජනතාව දැනුවත් කිරීම.**

පරිසරය විනාශ කිරීම් සම්බන්ධව වැටලීම් සිදුකිරීම සඳහා මහජනතාවගෙන් ලැබෙන තොරතුරු ඉතා වැදගත් වන බැවින් මෙ සම්බන්ධව තවදුරටත් මහජනතාව දැනුවත් කිරීමට පොලිස්පතිතුමා විසින් දැනුම් දී ඇත.

ඒ අනුව ඛනිජ ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා සිදුකරනු ලබන කැණීම්, ගං ඉවුරු ආශ්‍රිතව සිදුකරන නීති විරෝධී කැණීම්, කර්මාන්ත ශාලා මගින් අනීතිකව සිදුකරනු ලබන පාරිසරික හානි හා ශබ්ද දූෂණය ආදිය මගින් වන සතුන්ට සහ පරිසරයට ප්‍රබල බලපෑමක් සිදුකරනු ඇත.

**මෙලෙස සිදුකරනු ලබන පාරිසරික හානි සම්බන්ධව වැටලීම් සිදුකිරීම සඳහා පොලිස් විශේෂ කාර්යාංශයේ 1997 දරණ හදිසි ඇමතුම් අංකය ද, මධ්‍යම පරිසර අධිකාරිය මගින් 1981 දරණ හදිසි ඇමතුම් අංකය ද මේ වන විට හඳුන්වා දී ඇත. එම අංක වෙත මේ වන විටත් මහජනතාවගෙන් ලැබෙන තොරතුරු මත වැටලීම් සිදුකරනු ලබන අතර, ඉහත දුරකතන අංක සම්බන්ධව තවදුරටත් මහජනතාව දැනුවත් කර පාරිසරික හානියක් සිදුවන්නේ නම් ඉහත දුරකතන අංක වෙත තවදුරටත් තොරතුරු ලබා ගැනීම අවශ්‍යව ඇත.**

පාරිසරික හානි අවම කර ගැනීම සඳහා ඉහත දුරකතන අංක සම්බන්ධව මහජනතාව දැනුවත් කිරීමට ඔබ මාධ්‍ය මගින් ප්‍රචාරයක් ලබාදීමට අවශ්‍ය කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**